00323

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**පෙරපාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන**
**අවසාන පරීක්ෂණය - 2014**

**ESC 2315 - මුල් ළමාවිය සංවර්ධනය**

**කාලය - පැය තුනයි.**

---

දිනය - 2014.10.26 වේලාව - පෙ.ව. 09.30- ප.ව. 12.30 දක්වා

---

පළමු කොටසේ **සියළුම** ප්‍රශ්නවලටත් දෙවන කොටසේ ඕනෑම ප්‍රශ්න **තුනකට (03)** ත් පිළිතුරු සපයන්න.

**පළමු කොටස**

01. (i) පූර්ව ප්‍රසව සංවර්ධන අවධීන් නම් කරන්න.

(ii) ඉහත සඳහන් කළ ඕනෑම අවධියක් කෙටියෙන් විස්තර කරන්න.

02. (i) වර්ධනය සහ සංවර්ධනය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) දරුවන්ගේ "පූර්ණ සංවර්ධනය" යන්න නිර්වචනය කරන්න.

03. (i) 'කුඩා දරුවන් සඳහා උත්තේජන සැපයීම' යන්නෙන් අදහස් කරනුයේ කුමක් ද?

(ii) දරුවන්ගේ මනෝචාලක සංවර්ධනය සඳහා උත්තේජන සැපයිය හැකි ආකාර දෙකක් (02) ලියා දක්වන්න.

04. (i) කුඩා දරුවන්ගේ චිත්තවේග ගති ලක්ෂණ තුනක් (03) ලියා දක්වන්න.

(ii) උදාහරණයක් සපයමින්, කුඩා දරුවන් තුල බහුලව දක්නට ලැබෙන එක් චිත්තවේගයක ස්වභාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. (i) කුඩා දරුවන්ගේ 'සමාජ සංවර්ධනය' කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) කුඩා දරුවන්ගේ සමාජානුයෝජනය සඳහා අත්‍යවශ්‍ය තත්ත්වයන් දෙකක් (02) දක්වන්න.

06. (i) ඉගෙනීම සඳහා සූදානමෙහි වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ii) දරුවන්ගේ ඉගෙනීම සඳහා ඇති සූදානම නිර්ණය කිරීම සඳහා යොදාගත හැකි නිර්ණායක තුනක් (03) ලියා දක්වන්න.

07. (i) දරුවන්ගේ නිර්මාණශීලීත්වය වැඩිදියුණු වන සාධක තුනක් (03) නම් කරන්න.

(ii) දරුවන් ඔවුන්ගේ නිර්මාණශීලීත්වය විදහා දක්වන්නේ කෙසේදැයි උදාහරණයක් සපයමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. (i) බිළිඳෙකුගේ කායික සංවර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) බිළිඳෙකුගේ කායික අවශ්‍යතා දෙකක් (02) නම් කරන්න.

(ලකුණු 5 x8 = 40)

## දෙවන කොටස

09. (i) පියාජේගේ ප්‍රජානන සංවර්ධන අවධීන් හි මුල් අවධි දෙකෙහි (02) ගති ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

(ii) 'සමායෝජනය' සහ 'ප්‍රතියෝජනය' යන ක්‍රියාවලින් දෙක (02) පැහැදිලි කර, කුඩා දරුවන්ගේ ප්‍රජානන සංවර්ධනය, පරිසරයත් සමඟ අන්තර්ක්‍රියාකාරීත්වය තුලින් සිදුවන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(iii) පෙරපාසල් දරුවන් අයත් වන ප්‍රජානන සංවර්ධන අවධිය නම් කර. ඔවුන්ගේ ප්‍රජානන හැකියා සංවර්ධනය සඳහා සුදුසු ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී පෙරපාසල් ගුරුවරියකගේ භූමිකාව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

10. (i) කුඩා දරුවන්ගේ දළ සහ සියුම් චාලක හැකියා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) කුඩා දරුවන්ගේ දළ සහ සියුම් චාලක හැකියා සංවර්ධනයට සහයවීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(iii) දරුවන්ගේ, දළ සහ සියුම් චාලක හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ඔබට සංවිධානය කළ හැකි එළිමහන් ක්‍රියාකාරකම් දෙකක් (02) විස්තර කරන්න.

(ලකුණු 10)

11. (i) එක් උදාහරණය බැගින් සපයමින්, දරුවන්ගේ චර්යා රටාවන් දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) ඔබ විසින් ඉහත සඳහන් කල ඕනෑම චර්යා රටාවක් සංවර්ධනය සඳහා දෙමාපියන්ගේ භූමිකාව සාකච්ජා කරන්න.

(ලකුණු 06)

(iii) පෙරපාසල් දරුවන්ගේ ස්වාධීන චර්යා දෙකක (02) ගති ලක්ෂණ දක්වා, දරුවන්ගේ ස්වාධීන චර්යා සංවර්ධනය සඳහා පෙරපාසල් ගුරුවරියකගේ භූමිකාව සාකච්ජා කරන්න.

(ලකුණු 10)

12. (i) උදාහරණ දෙකක් (02) සපයමින් 'ඉගෙනීම' යන පදය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) කුඩා දරුවන්ගේ ඉගෙනුම් උපායමාර්ග තුනක් (03) විස්තර කරන්න.

(ලකුණු 06)

(iii) ඔබ විසින් ඉහත සඳහන් කළ ඕනෑම ඉගෙනුම් උපාය මාර්ග දෙකක් (02) පාදක කොට ගනිමින් පෙරපාසල් දරුවන්ගේ භාෂා කුසලතා සංවර්ධනය සඳහා සුදුසු ක්‍රියාකාරකමක් නිර්මාණය කරන්න.

(ලකුණු 10)

13. පහත සඳහන් ඕනෑම දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

(i) ළමා සංවර්ධනය සඳහා ආරය සහ පරිසරයේ බලපෑම
(ii) කුඩා දරුවන් විසින් සදාචාරාත්මක චර්යා ඉගෙනීම
(iii) දරුවාගේ චිත්තවේග සංවර්ධනය සඳහා මවගේ අධ්‍යාපන මට්ටමේ සහ ආකල්පවල බලපෑම

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**FINAL EXAMINATION – 2014**
**ADVANCED CERTIFICATE IN PRE-SCHOOL EDUCATION PROGRAMME**
**ESC2315– EARLY CHILDHOOD DEVELOPMENT**
**DURATION – THREE (03) HOURS.**

| Date: 26th October 2014 | Time: 9.30 a.m. – 12.30p.m. |
|---|---|

Answer all questions in **Part I** & three (03) questions from **Part II**.

## PART I

01. i. Name the stages in prenatal development.
    ii. Briefly describe any one of the stages mentioned above.

02. i. Briefly explain, the difference between Growth and Development.
    ii. Define 'Total Development" of children.

03. i. What is meant by 'Providing Stimulation' for young children?
    ii. Give **two (02)** forms of providing stimulation for children's psychomotor development.

04. i. State **three (03)** characteristics of emotions of young children.
    ii. Citing an example, briefly explain the nature of one of the very common emotions seen in young children.

05. i. Briefly explain, the 'social development' of young children.
    ii. Give **two (02)** essential conditions for socialization of young children.

06. i. Briefly discuss the importance of readiness in learning.
    ii. Give **three (03)** criteria to determine the child's readiness to learn.

07. i. Name **three (03)** conditions that foster creativity in young children.
    ii. Citing an example, briefly explain how children express their creativity.

08. i. Briefly explain, 'Physical Development' of an infant.
    ii. State **two (02)** physical needs of an infant.

(8 x 5 = 40 marks)

## PART II

09. i. Briefly describe the characteristics of the first two stages of cognitive development described by Piaget.

(04 marks)

ii. Explaining the **two (02)** processes assimilation and accommodation discuss, how the cognitive development of young children take place with the interactions of the environment.

(06 marks)

iii. Name the stage to which the pre-school children belong, and discuss the role of a pre-school teacher in organizing activities for children that suitable for their cognitive abilities.

(10 marks)

10. i. Briefly describe gross motor and fine motor abilities in young children.

(04 marks)

ii. Discuss the importance of supporting young children to develop their gross and fine motor abilities.

(06 marks)

iii. Describe **two (02)** out door activities you would organize to promote both gross and fine motor abilities in children.

(10 marks)

11. i. Citing **two (02)** examples, for each behavior, briefly explain two (02) forms of behavior patterns in children.

(04 marks)

ii. Discuss the role of parents in developing any form of behavior pattern you have mentioned above.

(06 marks)

iii. State **two (02)** characteristics of independent behavior in pre-school children and discuss the role of pre-school teacher in developing independent behaviors in children.

(10 marks)

12. i. Citing **two (02)** examples, briefly explain the term 'Learning'

(04 marks)

ii. Describe **three (03)** learning strategies in young children.

(06 marks)

iii. Based on any **two (02)** learning strategies mentioned above, design an activity for development of language skills of pre-school children.

(10 marks)

13. Write short notes on any **two (02)** of the following.

i. Influence of heredity and environment on child development.

ii. Learning moral behaviors by young children.

iii. The influence of mothers' educational level and attitudes on child's emotional development.

(10 x 2 = 20 marks)

*-copyright reserved -*